**2024-05-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනජීවී සංචාරක නිවාසවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනට කළමනාකරණය කරනු ලබන සංචාරක නිවාස 52ක් පවතින අතර, එමඟින් සපයනු ලබන සේවාවන් වඩාත් ගුණාත්මක තත්ත්වයකට පත් කිරීම සඳහා එම නිවාසවල භෞතික පහසුකම් වැඩිදියුණු කළ යුතු බව පෙනී ගොස් ඇත. එම කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් දායකත්වය ලබා දීමට උනන්දුවක් දක්වන පෞද්ගලික අංශයේ ආයතන සහ පාර්ශ්වයන්ගේ දායකත්වය ලබා ගෙන එම සංචාරක නිවාස, ඉහළ ගුණාත්මකභාවයකින් යුත් සේවාවන් සැපයීමට හැකි වන පරිදි වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ විධිවිධානයන්ට පටහැනි නොවන ආකාරයෙන් භෞතිකව වැඩිදියුණු කිරීම යෝග්‍ය බවට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, එකී පාර්ශ්වයන් වෙතින් අභිප්‍රාය ප්‍රකාශ කිරීම් කැඳවීමටත්, ඒ අනුව තෝරාගනු ලබන පාර්ශ්වයන් හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුම්වලට එළඹීමටත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඇමතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **2024 වර්ෂයේදී ජාත්‍යන්තර පොල් ප්‍රජාවගේ 60 වැනි සැසිවාරය සහ අමාත්‍ය හමුව ශ්‍රී ලංකාවේදී පැවැත්වීම**

විදේශ විනිමය ඉපැයීම් වැඩි කර ගැනීම, සාමාජික රටවල් අතර ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ පොල් ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සහයෝගිතාව වැඩිදියුණු කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ජාත්‍යන්තර පොල් ප්‍රජාවගේ 60 වැනි සැසිවාරය සහ අමාත්‍ය හමුව මෙම වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජනා වී ඇත. ඒ අනුව, පොල් සංවර්ධන අධිකාරිය විසින් උපයන ලද ආදායම් හා පොල් අංශයේ පෞද්ගලික ආයතන කිහිපයක දායකත්වයෙන් එකී සැසිවාරය සහ අමාත්‍ය හමුව මෙම වර්ෂයේ නොවැම්බර් මාසයේදී කොළඹදී පැවැත්වීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

**03. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඕමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවල හිඟ ව්‍යවස්ථාපිත දීමනා පියවීම**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඕමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවල හිඟ ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි නොපියවීම හේතුවෙන් විවිධ පළාත්වල අධිකරණයන්හි නඩු 2,000කට අධික ප්‍රමාණයක් විභාග වෙමින් පවතී. එකී හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා එම ආයතනයන්හි ඉපයීම් ප්‍රමාණවත් නොවන බැවින්, ඒ සඳහා අවශ්‍ය මුදල් ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී එම ආයතනවල ඉපයීම්වලින් අදාළ ණය මුදල කොටස් වශයෙන් නිරවුල් කිරීම යෝග්‍ය බව හඳුනාගෙන ඇත. එම ආයතන විසින් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදලේ මුළු දායකත්ව මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසුව, එම මුදලට අදාළව ගෙවිය යුතුව පවතින අධිභාර මුදල අඩු කිරීමට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන පරිදි කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව පවතී. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඕමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවලට අදාළ හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම පිණිස අවශ්‍ය අරමුදල් මහා භාණ්ඩාගාරය වෙතින් සලසා දීමටත්, එම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නිරවුල් කිරීමෙන් පසු 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන පරිදි එකී ආයතනයන් විසින් ගෙවිය යුතු අධිභාර මුදල්වලින් අඩු කළ හැකි උපරිම ප්‍රමාණය අඩු කිරීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට උපදෙස් දීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම**

ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,092ක් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335ක් රටපුරා ක්‍රියාත්මක වේ. සමෘද්ධි පනතේ විධිවිධාන පරිදි එම ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති වාර්ෂිකව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනය කරනු ලබන අතර, ජාතික විගණන කාර්යාලයේ විගණනයට ලක් විය යුතු බවට වන විධිවිධාන සමෘද්ධි පනතේ ඇතුළත්ව නොමැත. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති රජයේ විගණන කාර්යාලය විසින් ද විගණනය කිරීම මඟින් ඒවායේ කාර්යයන් විනිවිදභාවයෙන් පවත්වා ගැනීමට සහ මහජනතාවගේ විශ්වාසය හා

පිළිගැනීම වර්ධනය කිරීමට හැකිවනු ඇති බව හඳුනාගෙන ඇත. ඒ සඳහා විධිවිධාන පනවමින් 2017 අංක 2 දරන දිවිනැඟුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීමටත්, ඒ සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **සීමාසහිත ලංකා පොහොර සමාගම හා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කිරීමට අදාළව ක්‍රියාත්මක කළ යුතු අනිවාර්ය විශ්‍රාම වන්දි ක්‍රමය**

සීමාසහිත ලංකා පොහොර සමාගම හා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කිරීමට අදාළව සේවකයින් සඳහා ක්‍රියාත්මක කළ යුතු අනිවාර්ය විශ්‍රාම වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ලැබීමට සේවකයින් 267 දෙනෙකු මනාපය පළ කර ඇත. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායයන්හි අතිරික්ත සේවකයින් ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද නිලධාරි කමිටුවේ නිර්දේශයන්ට යටත්ව, සීමාසහිත ලංකා පොහොර සමාගම හා සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කිරීමට අදාළව සේවකයින් සඳහා ක්‍රියාත්මක කළ යුතු අනිවාර්ය විශ්‍රාම වන්දි ක්‍රමය ක්‍රියාත්මක කිරීමටත්, යෝජිත අනිවාර්ය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පොහොර සමාගම් දෙකෙහි අරමුදල්වලින් රුපියල් මිලියන 844ක් වැය කිරීමටත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ගම්පහ බියගම මහ රෝහල සහ ළමා රෝහල ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවාවන් සඳහා වන ඉල්ලුම දිනෙන් දින ඉහළ යන බැවින්, එම දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශයක් යටතේ මහ රෝහලක් සහ සියලුම නවීන පහසුකම් සහිත ළමා රෝහලක් ස්ථාපිත කිරීමටත්, යෝජිත රෝහල් පද්ධතිය ඉදිකිරීම සඳහා බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිල්ලගහවත්ත සහ දෙල්ගහවත්ත යන ඉඩම් කොටස් 02 (අක්කර 07 රූඩ 03ක්) රජයේ තක්සේරු වටිනාකම මත පවරා ගැනීමටත්

2024-02-12 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. යෝජිත රෝහල ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට Sontell Group Hong Kong International Limited විසින් කැමැත්ත ප්‍රකාශ කරමින් යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එම රෝහල ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස එකී ආයතනය හා ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. 2018 අංක 2 දරන ප්‍රසාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම**

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සකස් කිරීමේදී 2018 අංක 2 දරන ප්‍රසාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනතට ආනුෂංගික සංශෝධන හඳුන්වාදීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ සඳහා වන පනත් කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති අතර එකී පනත් කෙටුම්පත් සඳහා නීතිපති විසින් නිෂ්කාශනය ලබා දී තිබේ. ඒ අනුව, 2018 අංක 2 දරන ප්‍රසාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත් සඳහා වන සංශෝධන පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස කමිටුවක් පත් කිරීම**

රාජ්‍ය සේවයේ විවිධ සේවක කණ්ඩායම් අතර පවතින වැටුප් විෂමතාවන් සම්බන්ධයෙන් එකී සේවක කණ්ඩායම් හා අදාළ වෘත්තීය සමිති විසින් වරින්වර ඉදිරිපත් කරනු ලැබ ඇති නියෝජනයන් සැලකිල්ලට ගෙන, එකී වැටුප් විෂමතාවන් පිළිබඳව කරුණු අධ්‍යයනය කර 2025 වර්ෂය සඳහා වන අයවැය මඟින් එම විෂමතාවන් නිවැරදි කිරීමට හැකි වන පරිදි වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

*************